මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර
තාක්ෂණික සේවා ගණයෙහි ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා වන
බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

1. සම්බන්ධ වන ආයතන.

1.1. දෙපාර්තමේන්තුව : මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව
යොමු අංකය :CPC/SD/3 දිනය : 2018.07.03

1.2. අමාත්‍යාංශය : මධ්‍යම පළාත් ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශය
යොමු අංකය : CPC/MI/HRM/11/08/06 දිනය :2018.07.03

1.3. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය:
යොමු අංකය :CPC/CS/2/3/SM/I (III) දිනය : 2018.07.18

1.4. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය :DMS/CP/0319 දිනය : 2018.06.28

1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය :NSCC/10/71/5/SR දිනය : 2018.01.23

2. ක්‍රියාත්මක දිනය : මෙම පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක වේ.

3. පත් කිරීම් බලධරයා : මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

4. සේවා ගණය පිළිබඳ විස්තර

4.1. සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික

4.2. ශ්‍රේණි : III, II සහ I ශ්‍රේණිය

4.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : ආයතනයන්හි විධායක කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා / පහසු කාරක කර්තව්‍යයන් අතුරින් ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ විශේෂිත නිපුණතාවයකින් යුත් කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත් කිරීම් බලධාරියා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

4.4. කාර්යයන් පැවරීම: ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට ආයතන ප්‍රධානියා විසින් පවරනු ලැබේ.

5. තනතුරේ ස්වභාවය : මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.09 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

6. වැටුප් :

6.1. වැටුප් කේත අංකය : MN 3 - 2016

6.2. වැටුප් පරිමාණය : රු. 31040 - 10×445 - 11×660 - 10×730 - 10×750 - 57,550/-

6.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | 01 | 31,040/- |
| II | 12 | 36,150/- |
| I | 23 | 43,480/- |

වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතුය.

7. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

7.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණි | අනුමත තනතුරු සංඛ්‍යාව | තනතුරේ රාජකාරි හා වගකීම් |
|---|---|---|---|
| ක්‍රීඩා පුහුණුකරු | III, II , I | 16 | 1. ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන විධිමත්ව පවත්වාගෙන යාම.<br>i. පුහුණු මධ්‍යස්ථානයට ලබා දී ඇති සියලුම ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ නඩත්තු කිරීම.<br>ii. පුහුණු මධ්‍යස්ථානයට අයත් සෙසු භාණ්ඩ හා දේපල ආරක්ෂා කිරීම.<br>2. ක්‍රීඩා පුහුණු කිරීම් ඉදිරි වැඩසටහන් අනුව පවත්වාගෙන යාම.<br>3. ක්‍රීඩා විෂයට අදාළ සැලසුම් සකස් කිරීම.<br>4. දිස්ත්‍රික්කයේ සිටින දක්ෂතම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් සමන්විත දිස්ත්‍රික් සංචිත පිහිටුවා ඒවා පවත්වාගෙන යාම.<br>i. ක්‍රීඩක ජීව දත්ත වාර්තා.<br>ii. ක්‍රීඩක කුසලතා වාර්තා.<br>iii. පර්යේෂණ වාර්තා.<br>iv. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පැමිණීමේ ලේඛන පවත්වාගෙන යාම<br>5. ක්‍රීඩා තරඟ, පුහුණු කඳවුරු සංවිධානය හා තරඟ විනිශ්චය කටයුතු.<br>6. ක්‍රීඩා අධ්‍යක්ෂවරයාගේ අනුමැතියට යටත්ව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව හෝ වෙනත් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන පිළිගත් ආයතන විසින් පවත්වනු ලබන ක්‍රීඩා ව්‍යාපෘතීන් සඳහා සහාය හා උපදෙස් ලබා දීම.<br>7. පුහුණු කටයුතු අධීක්ෂණය හා ක්‍රීඩා නිලධාරීන්ට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018. 09. 09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| | | | |
|---|---|---|---|
| | | | 8. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා මට්ටම, ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා අදාළ පුහුණුකරුවන්ගේ සහයෝගයෙන් තාක්ෂණික ඇගයීම් පරීක්ෂණ සංවිධානය.<br>9. ක්‍රීඩා නිලධාරීන්ගේ අධීක්ෂණය භාරව කටයුතු කිරීම.<br>10. භාණ්ඩ වට්ටෝරු පොත තුලනය කරමින් පවත්වාගෙන යාම.<br>11. පුහුණු මධ්‍යස්ථානයන්හි ක්‍රීඩා පිටි තාක්ෂණ අවශ්‍යතාවයන් සපුරාලීම.<br>12. සියලු පුහුණු මධ්‍යස්ථාන පිළිබඳව ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම.<br>13. පළාත් ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්, පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ හා දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි විසින් පවරන අමතර රාජකාරි වේනොත් ඒවා ඉටු කිරීම. |

7.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 16 කි. ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යයන් සඳහා III, II සහ I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

8. බඳවා ගැනීමේ ක්‍රමය

8.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නැත |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නැත |

8.2. සීමිත බඳවා ගැනීම

8.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

8.2.2. සුදුසුකම් :

8.2.2.1. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018.09.09 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

(අ)

I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගෙන තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

සහ

III. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් මට්ටමින් ( දිස්ත්‍රික් අතර) පැවැත්වෙන තරඟයන්හිදී 1 හෝ 2 ස්ථානයක් ලබා තිබීම, ජාතික ක්‍රීඩා උළෙලේ 1 , 2 හෝ 3 ස්ථාන ලබා තිබීම, ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ශූරතා තරඟවල 1, 2 හෝ 3 ස්ථාන ලබා තිබීම.

හෝ

(ආ)

I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.

සහ

II. දකුණු ආසියාතික තරඟ, ආසියාතික තරඟ, පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟ, ඔලිම්පික් තරඟ හෝ ලෝක ශූරතා තරඟ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර 1, 2 හෝ 3 ස්ථාන සඳහා පදක්කම් ලබා තිබීම.

සහ

III. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාව ලබා තිබීම.

සහ

IV. (අ) මධ්‍යම පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පිළිගත් ආයතනයක් මගින් අදාළ ක්‍රීඩාව සඳහා පවත්වනු ලැබූ මාස තුනකට (03) නොඅඩු පුහුණුකරු පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම.

හෝ

(ආ) ක්‍රීඩා පනත යටතේ අදාළ ක්ෂේත්‍රයට නියමිත ක්‍රීඩා සංගමය විසින් නිකුත් කරන ලද පුහුණුකරු බලපත්‍රයක් ලබා තිබීම.

හෝ

(ඇ) මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් 1998.05.28 දින අනුමත කරන ලද මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට අනුව බඳවා ගන්නා ලද නිලධරයන් ක්‍රීඩා පුහුණුකරු තනතුරට උසස් කිරීමේදී එම ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් සුදුසුකම් අදාළ වේ.

8.2.2.2. පළපුරුද්ද: ක්‍රීඩා නිලධාරි තනතුරේ වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ වැටුප් වර්ධක දහයක් (10) ක් උපයාගෙන ඇති ක්‍රීඩා නිලධාරියෙකු වීම.

8.2.2.3. කායික සුදුසුකම්: මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

8.2.2.4. වෙනත් සුදුසුකම්:

8.2.2.4.1. පත්වීම ස්ථිර කර තිබීම.

8.2.2.4.2. අනුමත කාර්යසාධනය ඇගයීමේ පරිපාටියට අනුව වසර දහයක් (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

8.2.2.4.3. පූර්වාසන්න වසර 05 ක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

8.2.2.4.4. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

8.2.2.4.5. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්ව තිබීම.

8.2.2.4.6. අයැදුම්පත් කැඳවීමේ නිවේදනය පළ කරන දිනට 8.2.2 යටතේ ඇති සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018.09.09 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

8.2.3. වයස : අදාළ නොවේ.

8.2.4. බඳවා ගැනීමේ ක්‍රමය :

8.2.4.1. ලිඛිත විභාගය: අදාළ නොවේ.

8.2.4.2. වෘත්තීය පරීක්ෂණය: අදාළ නොවේ.

8.2.4.3. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය: විස්තරාත්මක ලකුණු පරිපාටිය - ඇමුණුම 01

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක සේවා පලපුරුද්ද | 30 | |
| අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් | 25 | |
| ක්‍රීඩා නිලධාරී තනතුරේ දක්වන ලද දක්ෂතා | 20 | අදාළ නොවේ |
| ක්‍රීඩා පුහුණු කිරීම තරඟ විනිශ්චය/තරඟ සංවිධානය පිළිබඳ අතිරේක පලපුරුද්ද | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතා | 05 | |
| එකතුව | 100 | |

8.2.4.3.1. යෝග්‍යතාවය ඇගයීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කිරීමේ බලධාරියා: මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

- ❖ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ ක්‍රීඩා නිලධාරී තනතුරට බඳවා ගැනීමේදී ඉදිරිපත් කරන ලද සහතික සඳහා නැවත ලකුණු ලබා දෙනු නොලැබේ.
- ❖ සුදුසුකම් පරීක්ෂා කිරීමද යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම සිදු කරනු ලැබේ.

සටහන:

(i) ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත එක් එක් යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත් කිරීම බලධරයා විසින් සිදු කරනු ඇත.

(ii) යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අයැදුම්කරුවන් මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ (MN 3 – 2016) සේවා ගණයේ III ශ්‍රේණියේ පුහුණුකරු තනතුරට බඳවා ගනු ලැබේ.

8.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර දැන්වීමක් පළ කිරීම මගින් අයැදුම්පත් කැඳවනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.09 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

9. කාර්යක්ෂමතා කඩඉම්

9.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය (ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව /වෙනත්) | විෂය නිර්දේශය |
|---|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට පත්වී වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය. | ඇමුණුම 02 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී/අන්තර්ග්‍රහණය වී වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය. | ඇමුණුම 03 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී/ අන්තර්ග්‍රහණය වී වසර 05ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය. | ඇමුණුම 04 |

9.2. කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද? : වසරකට දෙවරක්.

9.3. කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් .

10. භාෂා ප්‍රවීණතාව:

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 අනුව අදාළ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

සටහන: රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි විධිවිධාන ක්‍රියාත්මක වන දිනය වන 2007.01.01 දිනට පෙර බඳවා ගත් නිලධරයන් සඳහා අදාළ නොවේ.

11. ශ්‍රේණි උසස් කිරීම

11.1. III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම.

11.1.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

11.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. පරිවාස කාලයෙන් පසු පත්වීම ස්ථිර කර තිබීම.

II. නිළධර ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018.09.09 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

IV. උසස් වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

11.1.1.2. උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිළධාරියා විසින් නියමිත ආකෘති පත්‍රය පරිදි (ඇමුණුම 04) ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම සිදුකරනු ලැබේ.

11.2. සේවා ගණයේ II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

11.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

11.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම්.

I. නිළධර ගණයේ II වන ශ්‍රේණියේ වසර දහය (10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලසීමාවට අදාළ සියලු වැටුප් වර්ධක උපයා ගෙන තිබීම.

II. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

III. උසස්වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

11.2.1.2. උසස් කිරීමේ ක්‍රමය: සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් (ඇමුණුම 04) හි සඳහන් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I වන ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018.09.09 දින අනුමත කරන ලදී.

12. තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ.

ආණ්ඩුකාර ලේකම්

13. නිර්වචනය

13.1. "පරිපාටිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියයි.

13.2. "ආණ්ඩුකාරතුමා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා වේ.

13.3. " කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

13.4. " ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වේ.

13.5. "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වේ.

13.6. "අමාත්‍යාංශ ලේකම්"යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

13.7. "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වේ.

13.8. "පිළිගත් ආයතනය" යනුයෙන් අදහස් කරනුයේ, ජාතික ක්‍රීඩා විද්‍යායතනය හෝ ක්‍රීඩා විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය ක්‍රීඩා පිළිබඳ අධ්‍යාපන ආයතනයකි. මේ සම්බන්ධයෙන් තීරණය කිරීමේදී එම ආයතනයේ විෂය නිර්දේශය, කාලය හා දේශකයින්ගේ සුදුසුකම් පිළිබඳව රේඛීය අමාත්‍යාංශය විමසිලිමත් වනු ඇත. එමෙන්ම පාඨමාලාවේ සම්පූර්ණ කාලයෙන් 50% කට වැඩි ප්‍රතිශතයක් අදාළ ක්‍රීඩා විෂය ආවරණය විය යුතුය.

13.9. "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ,

(i) රජයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම සමත්වීම මගින්ද , සිදුකළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද , එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

13.10. " සක්‍රිය සේවා කාලය " යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :
දැනට (MN 3 – 2016) වැටුප් පරිමාණයෙහි III, II හා I ශ්‍රේණි යටතේ වැටුප් ලබන ක්‍රීඩා පුහුණුකරු තනතුරේ සිටින නිලධාරීන් පිළිවෙලින් එම වැටුප් පරිමාණයෙහිම III, II හා I ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. මෙම අන්තර්ග්‍රහණය හේතුවෙන් නිලධාරියා දැනට ලබමින් සිටින වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

15. අන්තර්කාලීන විධිවිධාන.

15.1. අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය යටතේ මෙම පරිපාටියට අන්තර්ග්‍රණය වන නිලධරයන් නව පරිපාටියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් සහ අනෙකුත් අවශ්‍යතා සපුරා ගත යුතුය. කෙසේ වෙතත් අන්තර්ග්‍රහණයට පෙර එම නිලධාරීන් සඳහා පෙර පැවති අනුමත සේවා ව්‍යවස්ථාවේ සඳහන් නියමිත ශ්‍රේණියෙහි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් /පරීක්ෂණවලින් සමත්ව හෝ නිදහස්ව ඇත්නම් මෙම ව්‍යවස්ථාවේ සඳහන් අදාළ කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

15.2. මෙම නව පරිපාටියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන් අදාළ ශ්‍රේණියේ සේවා කාලය, පෙර අනුමත සේවා ව්‍යවස්ථාවට අනුව ඔවුන් සිටි පංතියේ /ශ්‍රේණියේ සේවා කාලය ලෙස සලකනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

15.3. මෙම බඳවා ගැනීමේ පරිපාටිය යටතේ අලුතින් ඇතුළත් කර ඇති කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමට නියමිත සේවා කාලය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම සඳහා මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින සිට වසර 03 ක සහන කාලයක් ලබා දෙනු ලැබේ.

16. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි:

16.1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, මධ්‍යම පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි වලට නොහොත් නියෝග වලටද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලටද අනුව කටයුතු කළ යුතුය.

17. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

| | | |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | (සභාපති) | .................................... |
| 02. ජී.ජී.එස්.ඒ. දිසානායක මිය | (සාමාජික) | .................................... |
| 03. වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | .................................... |
| 04. ඒ.එම්.එම්.ජේ. නිස්තාර් මහතා | (සාමාජික) | A. J. M. M. Nisthar |
| 05. ඩබ්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා | (සාමාජික) | .................................... |

දිනය 2018.08.07

ආණ්ඩුකාර ලේකම්,

2018.08.07 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 18/928 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි ක්‍රීඩා පුහුණුකරු තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය ....07/8/2018......

....................................
ලේකම්
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නිල මුද්‍රාව
එල් ඒ. සුජාතා විජේසිංහ
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය.

**අනුමත කරමි / නොකරමි**

දිනය:-................................

....................................
පී. බී. දිසානායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2018/09/09

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | කරුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක සේවා පළපුරුද්ද | ක්‍රීඩා නිලධාරි තනතුරේ හෝ සමාන තනතුරක වසර 08 ක සේවා කාලයෙන් පසු එළඹෙන එක් වසරක් සඳහා ලකුණු 02 බැගින් | 30 |
| 02 | අතිරේක අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් | ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳව හෝ පරිපාලනය පිළිබඳ උපාධිය (ලකුණු 15 යි)<br><br>ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳව හෝ ක්‍රීඩා කළමනාකරණය හෝ පරිපාලන පිළිබඳ හදාරන ලද පාඨමාලා<br><br>දේශීය හෝ විදේශීය<br><br>I. වසරක් හෝ ඊට වැඩි - ලකුණු 10<br>II. මාස 06 ක් හෝ ඊට වැඩි - ලකුණු 07<br>III. සති 02 කට වඩා වැඩි - ලකුණු 05<br>IV. සත් 02 කට වඩා අඩු දින 02 කට වැඩි - ලකුණු 03 | 25 |
| 03 | ක්‍රීඩා නිලධාරි තනතුරේ දක්වන ලද දක්ෂතා | 01. ජාතික මට්ටම<br>කේවල තරඟ 1 වන ස්ථානය - ලකුණු 04<br>2 වන ස්ථානය - ලකුණු 03<br>3 වන ස්ථානය - ලකුණු 02<br><br>කණ්ඩායම් තරඟ 1 වන ස්ථානය - ලකුණු 03<br>2 වන ස්ථානය - ලකුණු 02<br>3 වන ස්ථානය - ලකුණු 01<br><br>02. ජාත්‍යන්තර මට්ටම<br><u>ආසියානු තරඟ</u><br><br>කේවල තරඟ 1 වන ස්ථානය - ලකුණු 06<br>2 වන ස්ථානය - ලකුණු 04<br>3 වන ස්ථානය - ලකුණු 02<br><br>කණ්ඩායම් තරඟ 1 වන ස්ථානය - ලකුණු 04<br>2 වන ස්ථානය - ලකුණු 02<br>3 වන ස්ථානය - ලකුණු 01<br><br><u>පොදු රාජ්‍ය මණ්ඩලීය/ලෝක ශූරතා/ඔලිම්පික්</u><br><br>කේවල තරඟ 1 වන ස්ථානය - ලකුණු 10<br>2 වන ස්ථානය - ලකුණු 08<br>3 වන ස්ථානය - ලකුණු 06 | 20 |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| | | | |
|---|---|---|---|
| | | කණ්ඩායම් තරඟ 1 වන ස්ථානය - ලකුණු 08<br>2 වන ස්ථානය - ලකුණු 06<br>3 වන ස්ථානය - ලකුණු 04 | |
| 04 | ක්‍රීඩා පුහුණු කිරීම, තරඟ විනිශ්චය/තරඟ සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද | 01. ක්‍රීඩා පුහුණු කිරීම ජාතික - ලකුණු 03<br>ජාත්‍යන්තර - ලකුණු 04<br>02. තරඟ විනිශ්චය ජාතික - ලකුණු 03<br>ජාත්‍යන්තර - ලකුණු 04<br>03. තරඟ සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද ජාතික - ලකුණු 03<br>ජාත්‍යන්තර - ලකුණු 04 | 20 |
| 05 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | | 05 |
| | | එකතුව | 100 |

සැ.යු. ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ තනතුරකට බඳවා ගැනීමේදී ඉදිරිපත් කළ සහතික සඳහා නැවත ලකුණු ලබා දෙනු නොලැබේ.

ඇමුණුම 02

අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ III ශ්‍රේණියේ ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගය පිළිබඳ විස්තර (පත්වීමේ දින සිට වසර 03 ක් ඇතුළත සමත් විය යුතුයි)

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. පුහුණු න්‍යාය හා ශාරීරික යෝග්‍යතාවය සහ පුහුණු සැලසුම්. | පැය 1½ | 100 | 40% |
| 2. පුහුණුකරු තනතුරට අදාළ විනිසුරු බලපත්‍රයක් ලබා තිබීම. | | | |

02. විභාගය පවත්වනු ලබන බලධරයා: මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

03. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට දෙවරක්

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. පුහුණු න්‍යාය හා ශාරීරික යෝග්‍යතාවය සහ පුහුණු සැලසුම් | පුහුණු න්‍යාය ශාරීරික යෝග්‍යතාවය සහ පුහුණු සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම |
| 02. පුහුණුකරු තනතුරට අදාළ විනිසුරු බලපත්‍රයක් ලබා තිබීම | අදාළ සංගමය විසින් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා අදියර 1 අදියර 2 අදියර 3 වශයෙන් නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා ලකුණු දෙනු ලැබේ. |

ඇමුණුම - 3

අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ II ශ්‍රේණියේ ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා වන කාර්යක්මතා කඩඉම් පරීක්ෂණය.

01. විභාගය පිළිබඳ විස්තර - (ක්‍රීඩා පුහුණුකරු II ශ්‍රේණියට පත් වී වසර 3 ක් ගතවීමට පෙර)

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. තෝරාගත් ක්‍රීඩාවක් පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් පැවැත්වීම | පැය 01 | 100 | 40% |

02. විභාගය පවත්වනු ලබන බලධරයා: මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

03. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට දෙවරක්

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. තෝරාගත් ක්‍රීඩාවක් පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් පැවැත්වීම. | වාර්ෂික, මාසික, දෛනික පුහුණු සැලසුම් පිළියෙල කිරීම. |

ඇමුණුම - 04

අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ I ශ්‍රේණියේ ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා වන කාර්යක්මතා කඩඉම් පරීක්ෂණය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.09 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

01. විභාගය පිළිබඳ විස්තරය (ක්‍රීඩා පුහුණුකරු I ශ්‍රේණියට උසස්වී වසර 05 ක් ගතවීමට පෙර)

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. තෝරාගත් ක්‍රීඩාවක් පිළිබඳ ප්‍රායෝගික පුහුණු සැලැස්මක් ඉදිරිපත් කිරීම. | පැය 01 | 100 | 40% |

02. විභාගය පවත්වනු ලබන බලධරයා: මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්.

03. විභාගය පවත්වනු ලබන කාලසීමාව: වසරකට දෙවරක්

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. තෝරාගත් ක්‍රීඩාවක් සඳහා ප්‍රායෝගික පුහුණු සැලැස්මක් ඉදිරිපත් කිරීම. | ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගි කර ගනිමින් ප්‍රායෝගික පුහුණු සැසියක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ සිදු කිරීම. |

## ඇමුණුම - 05

### ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය

1. නිලධාරියා පිළිබඳ තොරතුරු

    1.1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :-
    1.2. හැඳුනුම්පත් අංකය :-
    1.3. සේවා ස්ථානය හා එහි ලිපිනය :-
    1.4. තනතුර :-
    1.5. අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය :-

2. පත්වීම පිළිබඳ තොරතුරු

    2.1. පත්වීම් දිනය :-
    2.2. පත්වීම ස්ථිර කල දිනය:-
    2.3. සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :-

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

    2.4. සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :-

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස් වීමට අදාළ තොරතුරු

    3.1. උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : - II / I
    3.2. උසස් වීමට අපේක්ෂිත ධාරාව : - සාමාන්‍ය
        3.2.1. අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත
        3.2.2. සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කල දිනය : -

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

3.2.3. අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබේද? ඔව් / නැත

3.2.4. නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව් / නැත

3.2.5. උසස් වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

3.2.6. විනය දඬුවම් ලබා තිබේද? ඔව් / නැත

4. අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ............................ දින සිට සාමාන්‍ය කාර්යසාධනය යටතේ II / I ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය:..................................

..............................................

අත්සන

5. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම සඳහන් ..........................................................................................මහතා/මහත්මිය/මෙනෙවිය ................................................... සේවා ගණයේ ............................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමට පත් වෙමි. ඒ අනුව එම නිලධාරියා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම :-.................................

අත්සන :-.................................

දිනය :-.................................

නිල මුද්‍රාව :-.................................

6. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත් / නිවැරදි නොවන බවත් ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් / එකඟ නොවන බවත් කාරුණිකව දන්වමි.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.09 දින
අනුමත කරන ලදි.
ආණ්ඩුකාර ලේකම්

නම :-.................................

අත්සන :-.................................

දිනය :-.................................

නිල මුද්‍රාව :-.................................

7. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ නිර්දේශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව ............................... මහතා/මහත්මිය/මෙනවිය .................................. සේවා ගණයේ ..................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ ..................... දින සිට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම :-..................................

අත්සන :-..................................

දිනය :-..................................

නිල මුද්‍රාව :-..................................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.09 ........................ දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්